**මන්මුනේ බටහිර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 30 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්මුනේ බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**
**-----------------------------------------------------**

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක, පරිගනක උපාංග හා මෘදුකාංග ආදිය ලේඛනගත කිරීම සඳහා සභාව විසින් වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**-------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.3,533,451 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.8,064,362 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**
**------------------------------**

**3.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**
**-------------------------------------------**

සභාවට අයත් රෝද දෙකේ ට්‍රැක්ටරයක් සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් 2007 වර්ෂයේ සිට භාවිතය සඳහා යොදවා නොගෙන සහා පරිශ්‍රයේ රඳවා තිබූ නමුත් ඒවා අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව විසින් 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරනු ලැබූ 3.2.2 ඡේදයේ අනාවරණය කර තිබූ දේපළ මත වරිපනම් බදු අයකර නොගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

### 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |